# සමාජීය අරුතින් ගත්විට මගේ නිර්මාණවල පැහැදිලි දේශපාලනයක් තිබෙනවා

## ප්‍රවීණ ලේඛක ජයතිලක කම්මැල්ලවීර

> සමාජීය අරුතින් ගත්විට මගේ නිර්මාණවල පැහැදිලි දේශපාලනයක් තිබෙනවා. එහෙත් එය පක්ෂ දේශපාලනය හෝ යාන්ත්‍රික මාක්ස්වාදීන් විග්‍රහ කරන ආකාරයට නිර්ධන පන්ති-ධනපතිපන්ති දේශපාලනය නොවෙයි. එක වචනයකින් කියනවා නම් එය මානවවාදී දේශපාලනයයි. මා යුද්ධයට විරුද්ධයි. ජාතිවාදයට විරුද්ධයි. ස්ත්‍රී පීඩනයට විරුද්ධයි. කුලවාදයට විරුද්ධයි. ශ්‍රම සූරාකෑමට විරුද්ධයි.



'සන්නස' පුවත් පත වෙනුවෙන්
ප්‍රවීණ ලේඛක ජයතිලක කම්මැල්ලවීර සමග
**මාලන් බණ්ඩාර කපුවත්ත**
කළ සම්මුඛ සාකච්චාව

**සාහිත්‍යකරුවා කියන්නේ අති සංවේදී පුද්ගලයෙක්. ඔහුට සමාජයෙන් වියුක්තව තම නිර්මාණ කාර්යයේ නියැලිය හැකිද?**

සාහිත්‍යකරුවා සංවේදී පුද්ගලයෙකු බව ඇත්ත. ඒ එක්කම ඔහු කිසියම් සමාජයක සාමාජිකයකු ලෙස අනෙකුත් ජනයා සමග ජීවත්වන කෙනෙක්. ඒ අනුව තමා ජීවත්වන සමාජයේ සිදුවන හැලහැප්පීම් ගැන, සමාජයේ අනෙක් ජනයාගේ දුක වේදනාව සතුට ගැන අවධානයකින් තොරව හුදෙකලාව මනසින් මවාගත් ලෝකයක ජීවත් වෙනවා නම් ඔහු සංවේදී කෙනෙක් වන්නේ නැහැ. සාහිත්‍යකරුවාගේ සංවේදිතාව ගැන ලාංකික සාහිත්‍යයෙන් නිදර්ශන ගන්නවා නම් මහගම සේකර ඒ සඳහා හොඳම චරිතයක් යයි කියන්න පුළුවන්. ඔහුගේ බොහෝ නිර්මාණ, විශේෂයෙන් 'ප්‍රබුද්ධ' 'නොමියෙමි' වැනි කෘතිවල මෙය ඉතා හොඳින් ප්‍රකාශ වෙනවා. ඔහුගේ කාව්‍ය නිර්මාණ ඔහු තමා ජීවත්වන සමාජයට ජීවමානව බද්ධ වී සිටි ආකාරය පෙන්වනවා. වර්තමානයේ ලංකාව තුළ සාර්ථක නිර්මාණ කරුවන් ලෙස සැලකෙන සෑම කෙනෙකුගේ ම නිර්මාණවලින් අඩු වැඩි වශයෙන් මෙය පෙනෙනවා. එහෙත් මෙය සමහර කාලවලදී නොපෙනී යන්න පුළුවන්. එසේ වීමට සමාජීය හේතු වගේම පුද්ගලික හේතුත් බලපානවා.

**සාහිත්‍යකරුවෙකු සමාජ සංසිද්ධීන් හැර විශේෂයෙන්ම සෞන්දර්යාත්මක අනුභූතීන් තම නිර්මාණ කරණයට යොදා ගැනීම වැරදියි කියලද ඔබ කියන්නේ?**

මා සාහිත්‍යකරුවෙකු හැටියට මගේ නිර්මාණ භාවිතය සිදුවන්නේ සාහිත්‍ය නිර්මාණයක් ප්‍රථමයෙන් සෞන්දර්යාත්මක, කලාත්මක නිමැවුමක් විය යුතුය යන ආස්ථානයේ සිටයි. එය දේශපාලන සමාජ විග්‍රහාත්මක නැතහොත් දර්ශනික මතවාද ප්‍රකාශනයක් නොවිය යුතුයි. සාහිත්‍ය නිර්මාණයකට දර්ශනික මතවාද හෝ සමාජ විග්‍රහය වලංගු නැති බවක් එයින් කියැවෙන්නේ නැහැ. සාහිත්‍ය නිර්මාණයක් ඇසුරු කරන රසිකයාට එයින් අපූර්ව රසයක් ලැබිය යුතුයි. ඒ අපූර්වත්වය බොහෝවිට ගොඩනැගෙන්නේ එම නිර්මාණය කොතරම් සෞන්දර්යාත්මක පක්ෂයෙන් කොතරම් පොහොසත්ද යන සාධකය මතයි.

**කෙනෙක් ඔබට චෝදනා කළොත් ඔබ ඔබගේ නිර්මාණ හරහා කිසියම් දේශපාලන මතයක් ඉදිරිපත් කරනවාය කියා. එවිට ඔබේ පිළිතුර?**

මා යොවුන් වියේ සිටම සාහිත්‍ය නිර්මාණ යයි කිවහැකි යම් යම් දේ ලියා තිබෙනවා. නමුත් සමාජය මා සාහිත්‍යකරුවකු ලෙස හඳුනා ගන්නේ 1985දී පළ වූ මගේ ප්‍රථම කෙටිකතා පොත 'කළු සපත්තු' නිසයි. එම කෙටිකතා සංග්‍රහය පළ වන අවස්ථාව වන විට සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ජයකෙහෙළි නංවාගෙන සිටියේ 'ජනතාවාදී සාහිත්‍යය' යයි කී ප්‍රචාරකවාදී සාහිත්‍ය ප්‍රවනතාවයි. 'කළු සපත්තු' ඒ ගමන් මග වෙනස් කළ නිර්මාණයක් ලෙස එදා සෑම විචාරකයෙක්ම පෙන්වා දුන්නා. ඒ කෙටිකතා ලියන කාලයේ මම මාක්ස්වාදී පක්ෂයක පූර්ණකාලීනයෙක්. එදා සිට අද දක්වා මගේ සාහිත්‍ය නිර්මාණ දේශපාලන ප්‍රචාරක වාදයට විරුද්ධ කෘති ලෙස විචාරක පිළිගැනීමක් ලබා තිබෙනවා. සමාජීය අරුතින් ගත්විට මගේ නිර්මාණවල පැහැදිලි දේශපාලනයක් තිබෙනවා. එහෙත් එය පක්ෂ දේශපාලනය හෝ යාන්ත්‍රික මාක්ස්වාදීන් විග්‍රහ කරන ආකාරයට නිර්ධන පන්ති-ධනපතිපන්ති දේශපාලනය නොවෙයි. එක වචනයකින් කියනවා නම් එය මානවවාදී දේශපාලනයයි. මා යුද්ධයට විරුද්ධයි. ජාතිවාදයට විරුද්ධයි. ස්ත්‍රී පීඩනයට විරුද්ධයි. කුලවාදයට විරුද්ධයි. ශ්‍රම සූරාකෑමට විරුද්ධයි. මගේ නිර්මාණවල ඇති දේශපාලනය එයයි. පක්ෂ දේශපාලන ක්ෂේත්‍රයේ මගේ දේශපාලන මත ප්‍රකාශ වන්නේ සාහිත්‍ය නිර්මාණවලින් නොවෙයි. ඒ සඳහා මා වෙනත් ක්‍රියාකාරකම්වල යෙදෙනවා. මම අදත් වාමාංශිකයෙක්. එහෙත් කිසිම පක්ෂයක සාමාජිකයෙකු නොවෙයි. මා මාක්ස්වාදයට ගරුකරනවා. නමුත් යාන්ත්‍රික මාක්ස්වාදියෙක් නොවෙයි. දේශපාලන පක්ෂයක ගමන් මග තේමා කරගනිමින් මා එක නවකතාවක් ලියා තිබෙනවා. ඒ 'තාත්තලාගේ කතාව'යි. එය මා ලීවේ එම පක්ෂයේ ඉතිහාසය කෙරෙහි මගේ සිතේ පවතින ගෞරවය ප්‍රකාශ කරන්නටයි. එහි වුවද මම මානව සම්බන්ධතා කෙරෙහි ලොකු අවධානයක් යොමු කර තිබෙනවා.

**ඔබ මෙතෙක් කී දේ හරහා ඔබගේ නවතම සාහිත්‍ය නිර්මාණය වන 'කාගෙද වසන්තය' කාව්‍ය සංග්‍රහය ගැන කතා කරන්න ප්‍රවේශයක් ගතහොත්...**

'කාගෙද වසන්තයේ' එන කවිවලින් කවි හතරක් හැර අනෙක් සියල්ල ලියැවුනේ මා ඕස්ට්‍රේලියාවේ ගත කළ මුල් මාස හතර තුළයි. ඒවා ලියූ කවි නොවෙයි ලියැවුණු කවි. මා කවියට බෙහෙවින් ඇලුම් කළත් කවියකු වීමේ අපේක්ෂාවක් මා තුළ තිබුණේම නැහැ. කවිය සමහරු හිතන තරම් ලේසි නැති බව මම දන්නවා. මාතෘකා සොය සොයා බලෙන් ලියන කවි සාර්ථක වන්නේ නැහැ. කවිය අභ්‍යන්තරයෙන් පැනනැගිය යුතුයි. සමහරු එක එක අවස්ථා නිමිති කර ගෙන කවි, කෙටිකතා ලියනවා. වෙසක් කවි අවුරුදු කවි වෙසක් කෙටිකතා අවුරුදු කෙටිකතා ආදී වශයෙන් ලියනවා. මට නම් එසේ ලියන්න බෑ. පුවත් පත් සඟරාවල ඉල්ලුමට ලියන්නත් මට බැහැ.

'කාගෙද වසන්තය' පොතේ මා මානවවාදී දේශපාලනය යයි කී දේ ඇතුළත් කවි තිබෙනවා. 'විකිණීමට තිබේ' 'කොතැන වුවත්' 'පැන විමසුම්' 'සර්වජන' 'ඇයි මේ' 'උගත් පාඩම්' යන නිර්මාණ නිදසුන් ලෙස දක්වන්න පුළුවන්. එහෙත් මේ කවිවලද සමාජ දේශපාලන අරුත් ඇත්තේ සෞන්දර්ය තලයට යටින්. පුවත්පතේ ඉඩකඩ ගැන සලකා එක කවියක් පමණක් නිදසුන් ලෙස ගන්න.

### කොතැන වුවත්

මෙල්බන් නුවර අතුරු මගක
යුවළක් ඇවිද යති මට ඉදිරියෙන්
නොපෙනේ ඔවුනගෙ මුහුණු

ජංගම දුරකතනයකි පිරිමි සුරතෙහි
වම් අත ඔහුගේ නිදහස්ය
පැද්දෙයි ඒ අත
ගමනේ රිද්මයට

ගැහැණු දෑතෙහි දරුවෙකි
දරුවා නිදයි මව් උරහිසෙහි
ඒ ගැහැණු පිට වසා
එල්ලෙන ලොකු ගමන් මල්ලකි

පිරිමි කටහඬ දෙස් නගයි ගැහැණියට
වැටහුණි ඒ මගේ ම බස බව
මිහිතලේ කොතැන සිටියද
අප අප ම යයි කියති එයුවළ

එහෙත් 'එතෙරදී හමුවූ මිතුරෙකුට' යන කවිය වෙනස්. එය ලංකාවේ දේශපාලනයේ ජුගුප්සාජනක තත්වය මතුපිටම පෙන්නුම් කරනවා.

### එතෙරදී හමුවූ මිතුරෙකුට

හැරදමා නෑසියන් ගිනිගත්තු බිම්කඩක
පියාඹා ආවාද රුදුරු සාගර මතින්
මධුර ගී ගැයූවත් සඟවන්න හිතේ දුක
හඳුනන්න නොහැකිවෙද මට පුරුදු නුඹේ වත

ඉසිඹුවක් නැති රටක දිවාරෑ කඹුරලා
අලුත් තටු ණයට ගෙන ඒ මහරු දේශයෙන්
අළුගොඩේ මල් පිපෙනු බලන්නට යන දවස
කල්දමන්නට වෙලා තව දශක ගණනකට

සපුන් කැළ ගිනිපිඹියි, අළුමතින් දුම් නැගෙයි
ඇඳිවතද ගිනිතබන් නටත් එහි සිවුරු හොරු
මහළුවුන් නිදි වැදුණු රජගෙදර බිතක්කන
දනට වැඩි මහසඟුන් නෙත් පියා නිදිකිරයි

දවුල් බෙර සක් හඬින් ගිගුම් දෙයි පුර අහස
පිරිත් කඹ අත බැඳන් මඟුල් කති මැති-ඇමති
මහරජුට තුති ගයා වැඳවැටෙන අනුහසින්
පිරී පිම්බී වැඩෙයි දිනෙන් දින ඒ උදර

මහවෙයද පුදබිමද උරුමයට ලියාගෙන
රජපැටව් රජබලෙන් උනට රිසි කෙළි කෙළිති
දනන් ඇස අරින්නට අණබෙරය බැඳි එවුන්
ආවඩා ආයුබෝ කිය කියා බඩ වඩති

මේ කවිය මා ලිව්වේ 2014 ජුනි මාසයේ බේරුවල ප්‍රදේශයේ මුස්ලිම් ජනයාට එල්ල කළ ජාතිවාදී ප්‍රහාරයට විරෝධය පෑමක් හැටියටයි. ඒ අවස්ථාවේ මා රටතුළ හිටියා නම් මගේ හැඟීම් ප්‍රකාශ කරන්නේ වෙනත් ක්‍රියාකාරකමක් ඔස්සේයි. එවැන්නකට අවස්ථාවක් නැති තැන මා මගේ මැදිහත්වීම කළ ආකාරයයි ඒ.

**ඔබ මේ අනුභූතිය කවියකට ගොනුකර පොතක පළ කරන විට ඒ සමාජ තත්වය වෙනස් වී තිබෙන්න පුළුවන්. ඔබ කළ යුතුව තිබුණේ වහාම තම අදහස් ජනතාව හමුවට ගෙනයෑම නේද?**

ඔබ නිවැරදියි. මේ කවිය ලියන විට කවි පොතක් පළකිරීමේ අදහසක් තිබුණේ නෑ. මේ කවිය ලියූ වහාම 'රාවය' පුවත්පතට යැව්වා. නමුත් පළවුණේ නෑ.

**මා දන්නා විදියට 'රාවය' ඔබ ලියන දේවල් වාරණයකින් තොරව පළකරනවා. මේ කවිය එදා පළ නොකළේ ඇයි?**

සාහිත්‍යකරුවකු හැටියට ගොඩනගාගෙන ඇති ප්‍රතිරූපයට මේ කවිය හානියක් සිදු කරන්නේ යයි සංස්කාරක හිතන්න ඇතැයි මට හිතෙනවා.

**ඔබ කලින් කියමින් සිටි දේවල්වලට අනුව සුළු ජාතීන්ට විරුද්ධව ප්‍රහාර එල්ල කිරීම වැනි දේ රට තුළ සිදු වන විට සාහිත්‍යයට දේශපාලනය අවශ්‍ය නැතැයි සිතන සාහිත්‍යකරුවන් නිහඬව තම තමන්ගේ නිර්මාණ භාවිතයේ යෙදෙන එක ගැන ඔබ හිතන්නේ කුමක්ද?**

ගාමිණී වියන්ගොඩ, ධර්මසිරි බණ්ඩාරනායක, පරාක්‍රම නිරිඇල්ල, ධර්මසේන පතිරාජ, සරත් විජේසූරිය, ජයතිලක බණ්ඩාර, ඩබ්ලියු ජයසිරි, වැනි කලාකරුවන් සමග මා කාලයක් තිස්සේ එවැනි දේට විරුද්ධව ප්‍රසිද්ධ මැදිහත්වීම් කළා. ඒ ආකාරයට නැතත් සමාජ සංවේදීතාව ඇති සෑම කලාකරුවෙකුම එවැනි අවස්ථාවල තමන්ට හැකි කුමන මාර්ගයකින් හෝ මැදිහත්වීමක් කළ යුතු යයි මම හිතනවා. පසුගිය මාසය තුළ කලාකරුවන්ගේ සමාජ සංවේදීතාවයේ මට්ටම් රටට හොඳින් පෙනුණා. සමහරු කිසිවක් සිදු නොවන ගානට ඔහේ බලා සිටියා. සමහරු ප්‍රසිද්ධියේ නොවෙයි පුද්ගලික මිතුරන් සමග පවා අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියා. ඔවුන් ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් ලෙස සැලකිය හැකි නමුත් මානවවාදී කලාකරුවන් හැටියට නම් සලකන්න බැහැ.

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com